# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2337/10 - 2023 ජුනි මස 21 වැනි බදාදා - 2023.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/2015

**ආගාමික හා විගාමික පනත**

(351 වන අධිකාරය)

(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 73 වන වගන්තිය සමග කියවිය යුතු 52 වන වගන්තිය යටතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ නියෝග.

මහජන ආරක්ෂක අමාත්‍ය.

2023 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

කලින් කල සංශෝධිත 1956 පෙබරවාරි මස 24 වැනි දින අංක 10,896 දරන ලංකා ආණ්ඩුවේ *ගැසට් පත්‍රය* සඳහා වූ අතිරේකයේ පළ කරනු ලැබූ 1956 ආගාමික හා විගාමික නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 10අ නියෝගය ඉවත් කිරීමෙන් ; සහ

(2) එහි 13අ නියෝගයේ -

(1) 3 වන ඡේදයේ (i) වන, (ii) වන සහ (iii) වන අනුඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :-

1A - G 39741— 07 (2023/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"(i) වැඩිපුර නැවතී සිටි කාල සීමාව මුල් වීසා බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමේ දින සිට ගණන් බලනු ලබන දින හතක් (07) ඉක්මවා ඇති අවස්ථාවක දී සහ දින දහහතරක් (14) දක්වා ගත වී ඇති අවස්ථාවක දී අදාළ වීසා බලපත්‍ර ගාස්තුවට අමතරව ඇමරිකානු ඩොලර් දෙසීය පනහක් (250) දණ්ඩන මුදලක් වශයෙන් අයකර ගනු ලැබිය යුතු ය ; සහ

(ii) වැඩිපුර නැවතී සිටි කාල සීමාව මුල් වීසා බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමේ දින සිට ගණන් බලනු ලබන දින දහහතරක් (14) ඉක්මවා යන අවස්ථාවක දී අදාළ වීසා බලපත්‍ර ගාස්තුවට අමතරව ඇමරිකානු ඩොලර් පන්සියයක් (500) දණ්ඩන මුදලක් වශයෙන් අයකර ගනු ලැබිය යුතු ය ; ";

(2) එහි (3) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(3අ) (3) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද වැඩිපුර නැවතී සිටි කාල සීමාව මුල් වීසා බලපත්‍රයේ වලංගු සීමාව අවසන් වීමේ දින සිට දින හතක් (07) ඇතුළත ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන තැනැත්තකුට යම් දණ්ඩන මුදලක් නොගෙවා පිටත්වීමේ තොටේ දී අදාළ වීසා බලපත්‍ර ගාස්තුව ගෙවීමෙන් ශ්‍රී ලංකාවෙන් පිටත් ව යා හැකි ය."; සහ

(3) (3) වන ඡේදයට ඉක්බිතිවම දැක්වෙන (2) වන ඡේදය එහි (4) වන ඡේදය වශයෙන් අංකනය කිරීමෙන්.

EOG 06 - 0155

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.